රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
அரச நிதித் திணைக்களம்
DEPARTMENT OF PUBLIC FINANCE

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General — Tel. 94-11-2484614, Fax. 94-11-2431458, Email: dgpf@pfd.treasury.gov.lk
කාර්යාලය / அலுவலகம் / Office — Tel. 94-11-2484637, Fax. 94-11-2431458

பொதுத் திறைசேரி
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
செயலகம், கொழும்பு 01, இலங்கை.

මහා භාණ්ඩාගාරය
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.

General Treasury
Ministry of Finance, Economic and Policy Development
The Secretariat, Colombo-01, Sri Lanka.

Website: www.treasury.gov.lk — Gen. E-mail: info@pfd.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PFD/REG/WOL/ABS/General
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.06.16

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය</u>**

"වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය" යන මැයෙන් නිකුත් කර ඇති අංක PFD/RED/03/03/01 හා 2016.03.31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ.

02. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 05/2016 හි 03 ඡේදයේ 3.1.7 හා 3.2.7 විධි විධාන අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර එම භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කර ඒ බව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත සෑම වර්ෂයකම මාර්තු 31 හා ජුනි 30 දිනට පෙර දැනුම් දීමට කටයුතු කළ යුතුය.

03. දැනට අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/දිස්ත්‍රික් ලේකම් කාර්යාල විශාල ප්‍රමාණයක් භාණ්ඩ සමීක්ෂණ වාර්තා වල පිටපත් (භා. හා ග.ප. 66 සහ පොදු 47 ආකෘති ද සමඟ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කරන බව නිරීක්ෂණය කෙරේ.

04. මු.රෙ.507 හා මු.රෙ.756 යටතේ පත්කරන සමීක්ෂණ මණ්ඩලවල සියළුම වාර්තා මෙම දෙපාර්තමේන්තුවට යොමු කිරීම අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කරමි. ඒ අනුව, සමීක්ෂණ මණ්ඩලවල කටයුතු අවසන් කර අවසන් වාර්තා චක්‍රලේඛ විධිවිධාන පරිදි විගණකාධිපති වෙත යොමු කරන ආවරණ ලිපියේ පිටපත පමණක් මෙම දෙපාර්තමේන්තුවට යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

05. තවද, ඔබ ගණන්දීමේ නිලධාරියා ලෙස කටයුතු කරන ආයතනය යටතේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල කිහිපයක් පත්කර ඇති අවස්ථාවලදී එම සියළුම මණ්ඩලවල වාර්තා විගණකාධිපති වෙත යොමු කර ඇති බවට වන සාරාංශය මේ සමඟ අමුණා ඇති ආකෘති 01 ට අනුව සකස් කර පසුගිය වර්ෂය වෙනුවෙන් වූ සමීක්ෂණ මණ්ඩල කටයුතු අවසන් කරන ලද තොරතුරු ඇතුලත් සාරාංශ වාර්ථාව පවත්නා වර්ෂයේ ජූලි 30 දින හෝ ඊට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ජේ.සී. වැලිගමගේ
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

ආකෘති 01

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

<u>විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවල සාරාංශ වාර්තාව</u>

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 යේ ප්‍රකාරව 3.1.7 හා 3.2.7 පරිදි මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ........... වර්ෂයට අදාළව පහත සඳහන් භාණ්ඩ සමීක්ෂණ ඒකකවල සමීක්ෂණ කටයුතු අවසන් කර විගණකාධිපති වෙත වාර්තා ඉදිරිපත් කර ඇති බව සහතික කරමි.

| වැය ශීර්ෂයේ අංකය සහ නම (1) | සමීක්ෂණ ඒකකයේ නම (2) | සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කළ දිනය (3) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 හා 2020.06.16 දිනැති ලිපියේ (04) ඡේදය අනුව වාර්තාව විගණකාධිපති වෙත යොමු කළ බව රාජ්‍ය මුදල් දෙපා.ට දන්වන ලද දිනය (4) | . වෙනත් කරුණු (5) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

.......................................................................

අමාත්‍යාංශයේ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්

දිනය: